රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 06/2019

මගේ අංකය: EST-3/DICIP/06/0244
රාජ්‍ය පරිපාලන හා
ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2019.02.27

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන අනුව ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ වගන්ති සංශෝධනය කිරීම**

ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ VI වැනි පරිච්ඡේදයේ 2:9:6 උප වගන්තිය, XXVIII වැනි පරිච්ඡේදයේ 4 වගන්තිය, 9:2 උප වගන්තිය සහ XXXI වැනි පරිච්ඡේදයේ 3:2 උප වගන්තිය යන වගන්ති වෙත ඔබගේ අවධානය යොමු කරවමි.

02. එම වගන්ති 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන අනුව පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට 2017.01.31 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

I. VI වැනි පරිච්ඡේදයේ 2:9:6 උප වගන්තිය සංශෝධනය කිරීම

2:9:6 මාණ්ඩලික නිලධරයෙකුට හෝ ප්‍රධාන ලිපිකරුට/ප්‍රධාන රාජ්‍ය කළමනාකරණ සහකාරට හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් බලය පවරන ලද වෙනත් පුද්ගලයෙකුට හෝ හැර වෙන කිසිම නිලධරයෙකුට චරියා සටහන් පත්‍රයක් බැලීමට ඉඩ නොතැබිය යුතු ය. නිලධරයකුගේ විධිමත් ඉල්ලීමකට අනුව බලයලත් යම්කිසි මාණ්ඩලික නිලධරයෙකු ඉදිරිපිට දී තම චරියා සටහන් පත්‍රය බැලීමට ඔහුට ඉඩදිය යුතු ය. චරියා සටහන් පත්‍රයේ සඳහන් විස්තර නිවැරදි බවට සහතිකයක් එවැනි සෑම පරීක්ෂා කිරීමකටම පසු එම නිලධරයාගෙන් ලබාගත යුතු ය.

II. XXVIII වැනි පරිච්ඡේදයේ 4:3 උප වගන්තියට පසුව 4:4 ලෙස නව උප වගන්තියක් ඇතුළත් කිරීම

4:4 ඉහත 4:1, 4:2 සහ 4:3 උප වගන්තීන්හි සඳහන් තොරතුරු ඉල්ලා සිටින අවස්ථාවක දී 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතෙහි සඳහන් විධිවිධානවලට යටත්ව එසේ ඉල්ලා සිටින තොරතුරු ලබාදීමට අදාළ බලධරයා ක්‍රියා කළ යුතු ය.

III. XXVIII වැනි පරිච්ඡේදයේ 9:2 උප වගන්තියට පසුව 9:2:1 ලෙස නව උප වගන්තියක් ඇතුළත් කිරීම

9:2:1 ඉහත 9:2 උප වගන්තියෙහි සඳහන් විධිවිධාන 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ සඳහන් විධිවිධානයන්ට යටත්ව ක්‍රියාත්මක කළ යුතු ය.

IV. XXXI වැනි පරිච්ඡේදයේ 3:2 උප වගන්තිය සංශෝධනය කිරීම

3:2 එබඳු රජයේ නිලධරයෙකු විසින් 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ තොරතුරුවලට ප්‍රවේශවීමේ අයිතිවාසිකම ප්‍රතික්ෂේප කළ හැකි අවස්ථා පිළිබඳව වූ 5 වන වගන්තියේ සඳහන් කරුණු සම්බන්ධයෙන් හෝ රජය හෝ රජයේ දෙපාර්තමේන්තුවක් විවේචනය කිරීම සඳහාවත්, රාජකාරිමය වූ හෝ නොවූ හෝ සිය දුක්ගැනවිලි (උදා : සිය රාජකාරි ඉටු කිරීමට කාර්ය මණ්ඩල ප්‍රමාණවත් නොවීම සම්බන්ධ විවේචන හෝ පැමිණිලි; අතිරේක අරමුදල් නොසැපයීම සම්බන්ධයෙන් භාණ්ඩාගාරය වෙත එල්ල කරන විවේචන ආදිය) ප්‍රචාරය කිරීම සම්බන්ධයෙන් හෝ ජනමාධ්‍ය යොදා නොගත යුතු ය.

මෙම 3:2 උප වගන්තියේ කාර්යයන් සඳහා "ජනමාධ්‍ය" යනු "ශ්‍රව්‍ය, දෘශ්‍ය හෝ ලිඛිත වශයෙන්, පොදුවේ මහජනයාට හෝ පුද්ගල කණ්ඩායමකට හෝ ප්‍රවේශ විය හැකි වන සේ විද්‍යුත්, මුද්‍රිත හෝ රසායනික තාක්ෂණය උපයෝගී කොට ගනිමින් පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් හෝ ආයතනයක් විසින් ක්‍රියාත්මක කෙරෙන සන්නිවේදන කාර්යයකි"

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා
ආපදා කළමනාකරණ අමාත්‍යාංශය